ප්‍රකට රංගධරයන්ගේ ඇසුර හා ආභාසය ලැබීමට ඔහුට හැකි විය. ජෝන් ලයිලි, තෝමස් කිඩ්, තෝමස් ලොජ්, ක්‍රිස්ටෝපර් මාලෝ වැනි නාට්‍ය ක්ෂේත්‍රයේ විශිෂ්ටයෝ ඒ අතර වූහ. 'යුනිවර්සිටි විට්ස්' (සරසවි උගතුන්) යනුවෙන් ගෞරවයට පාත්‍ර වූ මෙම උසස් රංගධරයන්ගේ ආභාසය, ශේක්ස්පියර් තුළ සිටි අංකුර නාට්‍යකරුවාට වඩාත් ශක්තිමත්ව බිහි වන්නට අවකාශ සලසා දී ඇත. මෙවන් උගතුන්ගේ ඇසුර ලබමින් විලියම් ශේක්ස්පියර් එක් අතකින් ඔවුන්ගේ කෘති ඇසුරු කිරීමේ වාසනාව උදා කරගත්තේය. ඒ සමගම තවදුරටත් වැදගත් වන ආභාසයක් වූයේ උක්ත රංගධරයන් තම නිර්මාණ සඳහා ඇසුරු කළ මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කරන්නට හැකි වීමයි. එමගින් ශේක්ස්පියර් එම අවදිය තුළදීම එංගලන්ත අධ්‍යාපනයට බලපෑ ග්‍රීක, රෝම හා ප්‍රංශ මූලාශ්‍රයන් හදාරමින් ඒවායෙන් සෑහෙන තරම් පරිණත දැනුමක් ලබා ගන්නට සමත් විය.

ශේක්ස්පියර් මෙලෙසින් ලබාගත් දැනුම සමග තම නිර්මාණාත්මක අවධානය පුළුල් වපසරියක් දෙසට යොමු කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට සමකාලීන විචාරකයන්ගේ නිර්දය විවේචනයට ලක් වන්නට සිදු වූ අවස්ථා ද තිබුණි. එවන් ඇතැම් විචාරකයන් අතින් ශේක්ස්පියර් විවේචනයට ලක් වූයේ, 'ඉතිහාස නොපිට පෙරළූ' කෙනකු ලෙසිනි. මෙසේ සිදු වී ඇත්තේ සැබවින්ම ශේක්ස්පියර් ඉතිහාසයේ යටිතල පෙර තල මාරුවක් හිතාමතාම කර ඇති බැවිනි. කෙසේ නමුදු, ශේක්ස්පියර් ගැන වඩාත් සාධාරණ විවරණ ඉදිරිපත් කළ වියත්හු ද වූහ. ඒ අතුරෙන් ඉහත සඳහන් කළ මහාචාර්ය ජී. බී. හැරිසන් එක් අයෙකි. ඔහු දැක්වූ සාධනීය විවරණ අනුව, 'හැම්ලට්', 'ඔතෙලෝ', 'ජුලියස් සීසර්', 'මැක්බත්', 'වැනීසියේ වෙළෙන්දා' (මර්චන්ට් ඔෆ් වෙනිස්) යන නාට්‍ය එම කරුණු සනාථ කරන කෘති වෙයි.

ලෝක සාහිත්‍යයේ බැබළෙන විශිෂ්ට නාට්‍ය කරුවකු වන ශේක්ස්පියර් ශ්‍රී ලාංකික කලා කරුවන්ට හා රසිකයන්ට මෙන්ම ඉන්දියානු සමාජයට ද ආගන්තුක නිර්මාණ කරුවෙක් නොවේ. ශ්‍රී ලංකාව හා ඉන්දියාව යන දෙරටෙහිම ශේක්ස්පියර් නාට්‍ය පරිවර්තනයටත් එම පරිවර්තන මගින් නාට්‍ය නිෂ්පාදනයටත් කලා කරුවන් යොමු වූ අවස්ථා මීට උදාහරණ ලෙස ගත හැකිය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකික පරිවර්තකයන් අතින් පරිවර්තනයට ලක් වූ කෘති අතර 'මිම්මට මිම්ම' (මෙෂර් ෆෝ මෙෂර්), 'ඔතෙලෝ', 'වැනීසියේ වෙළෙන්දා' (මර්චන්ට් ඔෆ් වෙනිස්), 'දොළොස්වන රාත්‍රිය (ට්වෙල්ත් නයිට්), 'මැක්බත්', 'හැම්ලට්', 'රෝමියෝ ජුලියට්' යනාදී කෘති මගින් සිංහල නාට්‍යකරුවන් ලද පෝෂණය ද අමතක කළ නොහැකිය. ඉන්දියාව තුළ ද ශේක්ස්පියර් නාට්‍ය පිළිබඳ අවධානයක් යොමු කළ විද්වතුන් අතින් එම නාට්‍ය කෘති කිහිපයක පරිවර්තන සිදු වී ඇත. විශේෂයෙන්ම එම නාට්‍ය යම් තරමක් දුරට හෝ ස්වදේශීය මුහුණුවරක් ගන්වමින් ඉදිරිපත් කරන්නට ගත් වෑයම, ගැන ද කියවෙයි. මේ සඳහා 'ශේක්ස්පියර් වාලා' සමාගම විශේෂ උනන්දුවක් දක්වා ඇත. ඉන්දියාව තුළ ශේක්ස්පියර් නාට්‍ය උර්දු හා හින්දි බසින් මෙන්ම ඉංග්‍රීසි බසින් ද ජනතාව අතරට ගෙන යාමේ උත්සාහයක් දරා ඇත.

ශේක්ස්පියර් නම් වූ මහා නාට්‍ය කරුවා බොහෝ විට 'මහා කවි විලියම් ශේක්ස්පියර්' නමින් හැඳින්විණ. ඉංග්‍රීසි බසින් ලියූ ශ්‍රේෂ්ඨතම ලේඛකයා ලෙස මොහු හැඳින්වීමට ද පියවර ගෙන ඇති බව පෙනේ. ලෝකය තුළ මෙතෙක් පහළ වූ අති උත්කෘෂ්ට නාට්‍ය කරුවා ලෙස ශේක්ස්පියර් හඳුන්වනු ලැබීමෙහි ද සාධාරණත්වයක් ඇත. එංගලන්තය තුළ මොහු හඳුන්වනු ලැබූයේ, 'ජාතික කවියා' ලෙසිනි. ඔහු පිළිබඳ ඇගයීමෙහි උච්ච අවස්ථාවක් ලෙස 'බාර්ඩ් ඔෆ් ඒවන' යන විරුදාවලියෙන් කරනු ලැබූ හැඳින්වීම සැලකිය හැකිය. ඉහතින් දැක්වූ පරිදි ශේක්ස්පියර් 'ස්ට්‍රැට්ෆර්ඩ් අපෝන් ඒවන්' හි උපත ලැබූ බව කියවෙන අතර ඔහුගේ උපන් දිනය ලෙස සඳහන් වන්නේ 1574 අප්‍රේල් මස 23 වැනි දිනයයි. එසේ වුවද මේ පිළිබඳව පවතින මතභේද සලකන විට ඔහුගේ උපන් දිනය නිශ්චිත ලෙස කිව නොහැකි බවත් අප්‍රේල් මස 23 යනු ඔහු බෞතීස්ම කරනු ලැබූ දිනය බවත් තව දුරටත් සඳහන් වෙයි. එමෙන්ම 1616 අප්‍රේල් මස 23 වන දින ඔහු අභාවප්‍රාප්ත වූ බවට ඉහත දැක්වූ පරිදි පිළිගැනීමක් ඇතත් ඒ පිළිබඳව පවතින තවත් මතයක් වනුයේ එම දිනය 23 නොව 26 වන බවයි. කෙසේ නමුදු, 1564 සිට 1616 අතර වූ අඩසියවසකට දෙවසරකට වැඩි තරම් වන කාලසීමාවක් තුළදී මෙම මහා කවියා විසින් කරනු ලැබ ඇති කලාත්මක හාස්කම් විශ්ව සාහිත්‍යය පුරාම නොමැකෙන සේ ලියවී ඇත යන්න සාධාරණ නිගමනයකි. කලාකරුවකු විෂය කරගන්නා කවර තේමාවක් වුවද තත්කාලීන සමාජයට පමණක් නොව සර්වකාලීන වශයෙන් ද අදාළත්වයක් තිබීම මෙන්ම එම නිර්මාණ මගින් සමාජයට හරවත්, රසවත්, දැනුමක් හා අවබෝධයක් ද ලබා දීම අතිශය වැදගත්ය. එමගින් මහා කවි විලියම් ශේක්ස්පියර් සදාකාලිකව රසික මනසේහි රැඳී පවතිනු ඇත.




